# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,473 — 1965 අගෝස්තු 7 වැනි සෙනසුරාදා — 1965.8.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

ඇෆ්සී/ඇම./80 දරණ ආහාර මිල ආඥාව — හරක්මස්

### මිළ පාලන පනත

#### ආඥාව

පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන්පත් ට්‍රැවිස් ඔගස්ටින් ලැඩිස්ලෝස් ලුඩෝවයික් වන මම, (173 වන අධිකාරිය) දරණ මිළ පාලන පණතේ 3(2) වගන්තිය හා කියවෙන 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව මෙම නියෝගයෙන්—

(1) 1964 ඔක්තෝබර් මස 2 වෙනි දින අංක 14,190 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරණ ලද 1964 සැප්තැම්බර් මස 29 වන දින අංක ඇෆ්සී/ඇම්/76 දරණ මිළ නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 2 වන සහ 3 වන තීරයන්හි සඳහන් මිල ඒ තීරණයන්හි මුදුනේ සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක්මස් එම උපලේඛනයේ 1 වන තීරයේ වූ අනුරූප සටහනෙහි සඳහන් ප්‍රදේශය තුළ විකිණියයුතු උපරිම මිළ ලෙස වහාම ක්‍රියාත්මක කළ යුතුය.

(3) මෙම ආඥාවේ කාර්ය සඳහා—

(අ) ''හරක්මස්'' යන පාඨයෙන් හරකුන්ගේ සහ මීහරකුන්ගේ මස් අදහස් කෙරෙයි. එහෙත් සියලුම වර්ගවල මාංශාවශේෂ ඉන් බැහැර කළයුතුය.

(ආ) ''හරක්මස්'' යන පාඨයට ශීතකළ ලුනු දැමූ හෝ මදක් ශීත කැවූ පිටරටින් ගෙන්වනලද හරක්මස් හා යම් වර්ගයක මාංසාවශේෂ මීට ඇතුළත් නොවේ.

(ඇ) සතකුගේ මළකුණු විකිණීම සඳහා මස්මඩුවේ පිළිවෙල කොට ඇති අයුරින් (එනම්, හිස, හම, බඩවැල්, මාංසාවශේෂ, කුර සහ සාමාන්‍යයෙන් දුවත් කරනු ලබන කොටස් හැර) විකුණන විට එම ''තනිබර අනුව'' කෙරෙන විකිණීමක් ලෙස සැළකිය යුතුය.

(4) කටු සහිත හරක්මස් විකිණීමේදී මේ සමග විකුණූ කටුවල බර විකුණූ මුළු බරින් 25%කට වැඩි නොවිය යුතුය.

(5) මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගයකට සහ ශ්‍රෙණියකට අයත් හරක්මස් තම ස්ථානයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ශ්‍රෙණියේ හරක්මස් සම්බන්ධයෙන් මේ ආඥාවෙන් නියමිත උපරිම මිල සඳහන් කළයුතු දැන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළයුතුය.

(6) හරක් මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශනය කළයුත්තේ ඒ සඳහා වෙන්කොට ඇති වෙළඳපිල්වල පමණක් වූ අතර එම වෙළඳපිළ්වල වෙනයම් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළයුතුය.

(7) මෙහි වූ උපලේඛනයේ 1 වෙනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වෙළඳපිලෙහි එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් පමණක් විකුණන බවට ඒ හරක්මස් විකුණන වෙළඳපිලෙහි පැහැදිලිව පෙනෙන ලෙස දැන්වීමක් ප්‍රදර්ශනය කළයුතුය.

(8) එක් ගණුදෙනුවක් කිරීමේදී හරක්මස් සමග මාංසාවශේෂ විකුණනු ලබන විට හරක්මස් මාංසාවශේෂවලින් වෙන්කොට කිරා විකිණිය යුතුය.

(9) සෑම වෙළෙන්දකුම හරක්මස් විකුණන කල්හී, හරක්මස් ගැනුම්කරු විසින් මිළයට ගන්නා හරක්මසෙහි සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකිවන සේ තම තරාදිය හෝ තරාදි තිබිය යුතුය.

(10) මෙහි වූ උපලේඛනයෙහි සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ හරක්මස් විකුණන සෑම වෙළෙන්දකුම හරක්මස් ගැණුම්කරු විසින් ඉල්ලා සිටි විට පහත සඳහන් කරුණු දක්වෙන කුවිතාන්සියක් ඔහුට දියයුතුය :—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ හරක්මස් ප්‍රමාණය (බර අනුව),

(ඇ) විකුණූ හරක්මස් වර්ගය, සහ

(ඈ) විකුණූ හරක්මස් ප්‍රමාණයට ගෙවූ මුදල.


1193——ආර් 7970—6,910 (65/8)

(11) මෙම ආඥාවෙන් උපරිම මිළ නියම කරනලද සෑම ප්‍රදේශයක් තුළම කිසිවෙකු විසින් උපලේඛනයෙහි සඳහන් භාණ්ඩය වෙන කිසියම් මසක් හෝ මාංසයක් සමග කලවම් කොට නොවිකිණිය යුතුය.

(12) උපලේඛනයෙහි සඳහන් භාණ්ඩය විකුණන කල්හි ඒ භාණ්ඩය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක් වුවහොත් එහි මිළද එම උපලේඛනයෙහි 2 වන සහ 3 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් විය යුතුය.

(13) මෙහි ආඥාවෙහි කාර්ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්න ඇවර්දුපොයි බරක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතුය.

1965 අගෝස්තු මස 3 වෙනි දින අ.භා. 4 ට පුත්තලම දිසාපති කායර්‍යාලයේදී අත්සන් කරන ලදි.

ටී. ඒ. ඇල්. ලූඩෝවයික්,
පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන.

## උපලේඛනය

### හරක්මස් සඳහා උපරිම මිල

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>හරක්මස් (කටු රහිත) රාත්තලක උපරිම මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>හරක්මස් (කටු සහිත) රාත්තලක උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| (1) දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය ඇතුළත සියලුම ප්‍රදේශ ... | 0 90 | 0 80 |
| (2) මාදම්පේ සුළුනගර සභාවට සහ හලාවත නාගරික සභාවට අයත් ප්‍රදේශ හැර උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ ප්‍රදේශ ... ... ... | 0 80 | 0 70 |
| (3) හලාවත නාගරික සභාව තුළ වූ ප්‍රදේශ ... ... ... ... | 0 90 | 0 80 |
| (4) මාදම්පේ සුළුනගර සභාව තුළ වූ ප්‍රදේශ ... ... ... ... | 0 80 | 0 70 |
| (5) පුත්තලම නාගරික සභාව තුළ වූ ප්‍රදේශ ඇතුළු පුත්තලම් පත්තු සහ කඩවත් ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... ... | 0 85 | 0 75 |
| (6) කල්පිටිය සුළු නගර සභාව තුළවූ ප්‍රදේශ ඇතුළු කල්පිටිය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ ... | 0 95 | 0 85 |
| (7) රාජවන්නි පත්තු සහ කුමාරවන්නි පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයන් තුළවූ සියලුම ප්‍රදේශ ... | 0 85 | 0 75 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන්වලට ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ අඩංගු නොවේ. ඒවා උපරිම මිල ගණන්ය. එයින් වැඩි වැඩි මිළකට විකිණීම නොකළ යුතුය.

8–329

---

අංක කේ. ඊ. 118 දරන ආහාර මිළ ආඥාව

අතිරේක ආහාර ද්‍රව්‍ය—මසූර් පරිප්පු

## මිළ පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් ගොඩ්වින් කොඩිතුවක්කු වන මම, මේ ආඥාවෙන්—

(1) 1963 අගෝස්තු 30 වන දින අංක 13,744 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 63.8.24 වන දින අංක කේ. ඊ. 107 දරන ආහාර මිල ආඥාව, වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙස එවකට නියම කර ඇති මිල ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිල විය යුතු ලෙස, වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(3) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි.

(4) මෙම ආඥාවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කායර්‍ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්, නියම කරමි.

(5) මෙම ආඥාවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින් ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල සූචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිල යම් ගනුදෙනුකරුවකුට පැහැදිළිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළයුතු බව නියම කරමි.

(7) මෙම ආඥාවේ කාර්යය සඳහා ''රාත්තල'' හෝ ''රා'' යන්නෙන් ඇවර්දුපොයි බරක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතු බව නියම කරමි.

(8) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින් ම ගැනුම්කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුළත් කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතු බව නියම කරමි.

(9) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම්, නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිලත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් වියයුතු බව නියම කරමි.

1965 අගෝස්තු මස 3 වන දින පෙ. ව. 10ට කෑගල්ලේ දී අත්සන් කරන ලදී.

ජී. කොඩිතුවක්කු,
කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක.

## උපලේඛනය

| 1 වන තීරය<br>ද්‍රව්‍යය | 2 වන තීරය<br>ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | 3 වන තීරය<br>තොග වෙළන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි, අධිකය<br>රු. ශ. | 4 වන තීරය<br>සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි, අධිකය<br>රු. ශ. |
| --- | --- | --- | --- |
| 1. මසූර් පරිප්පු පිටරට පාහින ලද (1 වැනි වර්ගය)<br>2. මසූර් පරිප්පු මෙරට පාහින ලද (2 වැනි වර්ගය) | 1. පරණකූරු කෝරලේ ආදයම් නිලධාරි කොට්ඨාශය | 2 0 | 0 02 |
| | 2. බෙලිගල් කෝරලේ ආදයම් නිලධාරි කොට්ඨාශය | 2 0 | 0 02 |
| | 3. ගල්බඩ කෝරලේ සහ කිණිගොඩ කෝරලේ ආදයම් නිලධාරි කොට්ඨාශය | 2 0 | 0 02 |
| | 4. අටුලුගම් සහ පනාවල් කෝරලේ ආදයම් නිලධාරි කොට්ඨාශය | 2 0 | 0 02 |
| | 5. දෙහිගම් කෝරලේ සහ පාත බුලත්ගම ආදයම් නිලධාරි කොට්ඨාශය | 2 0 | 0 02 |

සැලකිය යුතුයි.—මේ මිල ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිල නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

8–330

---

# ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

## ශ්‍රී ලංකා මහ බැංකුව

**1965 ජූලි මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

(මුදල් නීති පනතේ 34 වැනි (පරිච්ඡේදය 422) වගන්තියට අනුව)

| වගකීම් | රු. | රු. |
| --- | --- | --- |
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| ප්‍රාග්ධනය ... ... | 1,50,00,000 | |
| අතිරික්තය ... ... | 5,30,00,000 | |
| | | 6,80,00,000 |
| **වගකීම්** | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු ... | 93,63,54,221 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 5,66,09,850 | |
| | | 99,29,64,071 |
| නිකුත් කළ හා බෙරීමට ඇති ණයපත්... | | 5,33,94,000 |
| **තැන්පතු** | | |
| රජය ... ... | 80,33,932 | |
| රාජ්‍ය නියෝජ්‍යත්ව හා සංස්ථා ... | 1,50,41,314 | |
| වෙළෙඳ බැංකු ... ... | 14,18,88,755 | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... | 28,40,16,106 | |
| අනෙකුත් ... ... | 40,08,530 | |
| | | 45,29,88,637 |
| විදේශීය ණය ගැනීම් ... | | 21,69,743 |
| අනෙකුත් වගකීම් හා ගිණුම් ... | | 18,44,25,555 |
| | | 1,75,39,42,006 |

| වත්කම් | රු. | රු. |
| --- | --- | --- |
| **ජාත්‍යන්තර සංචිතය** | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) | 17,52,02,148 | |
| * විදේශීය රාජ්‍ය ණයපත් ... | 9,74,50,849 | |
| | | 27,26,52,997 |
| **දේශීය වත්කම්** | | |
| ණය සහ අත්තිකාරම් : | | |
| † රජයට ... ... | 19,84,57,925 | |
| අනෙකුත් අයට ... ... | 39,00,000 | |
| රජයේ හා රජය සහතික කළ ණයපත් | 1,16,02,67,891 | |
| | | 1,36,26,25,816 |
| අනෙකුත් වත්කම් හා ගිණුම් ... | | 11,86,63,193 |
| | | 1,75,39,42,006 |

* (අ) 1964 පෙබරවාරි 1 වැනි දින රු. 5,16.53 520ක ප්‍රකාශිත වටිනාකමට හා (ආ) 1965 මැයි 24 වැනි දින රු. 3,00,62,742ක වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් ණයපත් ඇතුළත් වේ. ඒ දිනවල මෙකී ණයපත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 4,22,52,314 සහ රු. 2,58,88,176ක් විය.

† 1961 අංක 7 දරන ජාත්‍යන්තර සංවර්ධන සංගම් ගිවිසුම් පනතේ සහ සංශෝධිත බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනතේ (424 පරිච්ඡේදය) නියමයන් ප්‍රකාර, ජා. මු. ම., ජා. ප්‍ර. ස. බැ. හා ජා. ස. ස. ට ලංකාවේ දයක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 6,01,57,925ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂපත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව 1965 ජූලි මස 31 වැනි දිනට බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි, ශේෂපත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

බී. ඇල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
ඔඩිටර් ජනරාල්.

1965 අගෝස්තු මස 7 වැනි දින, කොළඹ දී ය.

8–328

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/193

ආදයම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 අගෝස්තු මස 9 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දැක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 06 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 07 |

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 781.
1965 අගෝස්තු මස 7 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

7–353

---

## රේගු දැන්වීම අංක 64/5/53

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 අගෝස්තු මස 9 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 215 7/20 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 286 43 ... | 278 57 ... | 236 57 ... | 71 61 |

3 මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඩබ්ලිව්. පත්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ. 744/22.
1965 අගෝස්තු මස 7 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

7–354

ලංකාවේ වෑලව්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි